**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 ජුනි 17 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
------------------------------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) ඉකුත් වර්ෂයන් සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.840,443 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.840,443 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.464,339 ක් වුවද, එය රු.1,659,008 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන්ගේ හා සමුච්චිත අරමුදලේ වටිනාකම රු.1,194,669 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කර්මාන්ත 07 ක් සඳහා ගෙවිය යුතු සියයට 10 ක රඳවුම් මුදල් ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.346,151 ක් වැඩියෙන් ද, ආපසු ගෙවිය යුතු තැන්පතු එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 10,374,185 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.9,383,599 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,400,000 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

2008 වර්ෂයේ සිට සේවකයන්ගෙන් අඩුකර ගන්නා ලද රු.422,734 ක සේවක අර්ථ සාධක අරමුදල් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව නියමිත පරිදි අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.888,941 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.101,358 ක් විය. ඒ අනුව රු.787,583 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| බදු | 929,635 | 566,545 | 363,090 | |
| බදු කුලී | 1,849,936 | 1,182,009 | 667,927 | |
| බලපත්‍ර ගාස්තු | 379,160 | 402,160 | (23,000) | |
| සේවා සඳහා ගාස්තු | 105,000 | 244,265 | (139,265) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 800,610 | 711,317 | 89,293 | |
| වෙනත් ආදායම් | 332,312 | 121,467 | 210,845 | |
| ආදායම් ආධාර | 8,412,882 | 6,774,441 | 1,638,441 | |
| | | | | 2,807,331 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| පෞද්ගලික පඩිනඩි | 9,314,132 | 7,645,986 | (1,668,146) | |
| ගමන් වියදම් | 240,300 | 168,955 | (71,345) | |
| සැපයුම් හා උපකරණ | 339,488 | 224,453 | (115,035) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 2,070,745 | 1,345,325 | (725,420) | |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 329,144 | 329,844 | 700 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 458,158 | 240,553 | (217,605) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 946,507 | 148,444 | (798,063) | |
| | | | | (3,594,914) |
| අවාසිදායක විචලනය | | | | (787,583) |

2.3 **ආදායම් පරිපාලනය**

---------------------

2.3.1 වෙළඳ බලපත්‍ර හා අනෙකුත් ආදායම්

-------------------------------------------

වෙළඳ බලපත්‍ර ගාස්තු, ජල ගාස්තු හා කඩ කුලීවලින් 2013 ජනවාරි 01 දිනට පැවැති හිඟයෙන් අයකිරීමේ ප්‍රගතිය සියයට 3 ට වඩා අඩුවන අතර කඩ කුලීවලින් වර්ෂයේ බිල්කල ආදායමින් අයකිරීමේ ප්‍රගතිය සියයට 27 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

2.3.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවිදඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 1,198,201 |
| මුද්දර ගාස්තු | 429,235 |
| | 1,627,436 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

(අ) කන්දකැටිය හන්දියේ පිහිටි කඩ කාමර 05 ක බදුකරුවන් සමඟ එළඹ තිබූ ගිවිසුම්වල වලංගු කාලය 2007 ජූලි 15 දිනෙන් අවසන්ව් තිබුනද, එම ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. එම කඩ කාමර ඒවායේ පෙර අයිතිකරු වෙත දීර්ඝ කාලීන පදනම මත බදුදීම සඳහා 2012 වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබූ අතර, 2014 ජුනි වන විටත් එසේ බදුදී නොතිබුණි.

(ආ) සභාව සතු කන්දකැටිය හන්දියේ කඩ කාමර 05 ක් සහ පොල භූමියේ පිහිටි කඩ කාමර 03 ක් පළාත් පාලන කොමසාරිස්ගේ1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛයේ විධිවිධාන අනුව වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

-------------------

(අ) ධාවන තත්ත්වයේ පවතින **252-6371** කැබ් රථය භාවිතයට නොගෙන ධාවනයෙන් ඉවත් කර තිබුණි. **UPGY - 0873 අත්ට්‍රැක්ටරය** සහා භූමියේ භාවිතයට නොගෙන ගාල්කර තිබූ අතර, එහි ට්‍රේලරය දිරාපත් වෙමින් පැවතුනි.

(ආ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් 2007 වර්ෂයේ දී සභාවට ලබාදී තිබූ විදුලි ජනක යන්ත්‍රය 2011 වර්ෂය අවසානයේ සිට ක්‍රියා විරහිතව පවතින අතර, එය අලුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර සහා භූමියේ නිෂ්කාර්යව රඳවා තිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද ටොෂිබා (TOSHIBA) වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් අක්‍රියව භාවිතයෙන් ඉවත් කර තිබුණි.

3.3 **කසල බැහැර කිරීම**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකරන අතර එක්රැස් කරනු ලබන කසල මහවැලි අධිකාරියට අයත් රජ මාවතේ පිහිටි බුද්ධංකෝට්ටේ ඉඩමකට අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුනි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| **පුනරාවර්තන ආදායම** | | | | |
| බදු | 753,740 | 929,635 | 175,895 | 23.3 |
| බලපත්‍ර ගාස්තු | 515,000 | 379,160 | 135,840 | 26.3 |
| සේවා සඳහා ගාස්තු | 725,000 | 105,000 | 620,000 | 85.5 |
| වෙනත් ආදායම් | 169,700 | 332,312 | 162,612 | 95.8 |
| ආදායම් ආධාර | 7,461,172 | 8,412,882 | 951,710 | 12.7 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| ගමන් වියදම් | 196,000 | 240,300 | 44,300 | 22.6 |
| සැපයුම් හා උපකරණ | 425,000 | 339,488 | 85,512 | 20.1 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,400,000 | 2,070,745 | 670,745 | 47.9 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 390,000 | 329,144 | 60,856 | 15.6 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 810,000 | 458,158 | 351,842 | 43.4 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 196,716 | 946,507 | 749,791 | 381.1 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය